

# චේ

## අමරණීය මිනිසා

# 1

### හැඳින්වීම

*"චේ ග්වාරා" යන්න බිහි වූයේ ඒ නමේ අයිතිකරුවාගේ උපතින් නොවේ. චේ යනු චේ තුළින් ම එනම් ඔහුගේ ජීවිතය තුළින්ම පැන නැගුනු කිසිවක් විය. චේ වෙනත් කිසිදු විප්ලවවාදියෙකුට යා නොහැකි දුරක් ගමන් කළේය. ඔහු කියූ දේ එපරිද්දෙන් කළ මිනිසෙකු විය. බෙදුණු දකුණු ඇමරිකානු මහාද්වීපයේ අවාසනාවන්ත ඉරණම වෙනස් කිරීමටත්, එහි එක්සත්භාවයත් වෙනුවෙන් එතරම් පරමාදර්ශී කාර්ය භාරයක් ඉටු කළ වෙනත් කිසිවෙකු නොවීය. ඔහු ඒ බව ස්වකීය ජීවන භාවිතාවයෙන් පමණක් නොව, මරණයෙන් ද සනාථ කළේය. චේ, හැර දැමිය නොහැකි මතකයක් බවට පත් වූ වචනයෙන් විස්තර කළ නොහැකි අප්‍රමාණ මිනිසෙකු විය. වරෙක ජීන් පෝල් සාත්‍රේ "චේ යනු මේ කාලයේ විසූ ඉතාම පරිපූර්ණ මිනිසා" ලෙස හැඳින්වූයේ එහෙයිනි.*
*චේ බොහෝ හැකියාවන් එක් කොට තැනුනු පුදුම යන්ත්‍රයකි. වෛද්‍යවරයෙක් ලෙස, අර්ථ ශාස්ත්‍රඥයෙකු ලෙස, රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ලෙස, තානාපතිවරයෙකු ලෙස, උපාය සැලසුම්කරුවෙකු ලෙස, ලේඛකයෙකු ලෙස සහ ඉතාම ප්‍රකට ව ඇති පරිදි සටන් කරුවෙකු ලෙස චේ ඇදැහිය නොහැකි තරමට වෘත්තීමය විය.*

*ඔහු, ඔහු නියැළුණු ඕනෑම කටයුත්තක පරම අවසානය දැකීමේ පිපාසයකින් පෙළුණේය. චේගේ ඉතාම ප්‍රකට කියමනක එන පරිදි, -ජනතාව වෙනුවෙන් වැඩ කිරීම, මිනිසෙකුට ලැබිය හැකි උතුම්ම සතුට ය." යන්න ඔහු සම්බන්ධයෙන් ඉතාම නිවැරදි විය. කිසිවෙකු කරනා කාර්යයකට තව කෙනෙකු හිලවු කළ නොහැකි බව ඔහු ඇදහූ අතර එය තමන්ටම යොදා ගත්තේය. තමා විශ්වාස කළ සත්‍යයන් වෙනුවෙන් තමා ම පෙනී සිටියා පමණක් නොව ඒ වෙනුවෙන් සිය ජීවිතය පුද කළේය.*

*මේ ලිපි පෙළ පෙන්වා දෙන්නේ චේ අප හැර ගිය පසුවත්, අප ඔහු ජීවමාන ව තැබිය යුතු බවයි. ඔහුගේ ජීවනාදර්ශයන් විසින් වඩා යහපත් ලෝකයක් බිහි කර ගැනීමේ සිහිනය පන්නරය ලබනු ඇත. මහපොළොව මත ධනවත් ජාතීන්ගේ ද දිළිඳු ජාතීන් පාලනය කරන කෲර පාලකයන්ගේ ද පරම සතුරා ලෙස චේ මරණයෙන් මතු ද "ජීවත්" වනු ඇත.*

## 1. MASA

*අරගලය අවසන- සටන්කරු මියගිය සඳ*
*මිනිසෙකු පැමිණ ඔහු වෙත*
*හඬ ගා කීය මෙලෙසින:*
*"නොමැරෙනු මැනව- නොමැරෙනු මැනව*
*එතරම්ම ආදරෙයි මං නුඹට"*
*අහෝ එද, නොසෙල්විණි මළ සිරුර*

*ඉනික්බිති,*
*පැමිණ මිනිසුන් දෙදෙනෙක්*
*කීය නැවතත් මෙලෙසින:*
*"නැගී නිබයව එන්න ආපසු*
*හැර නොයනු මැන අපව"*
*අහෝ එද, නොසෙල්විණි මළ සිරුර*

*ඉනික්බිති,*
*පැමිණයහ මිනිසුන් විස්සක්*
*සියයක්, දහසක්*
*ලක්ෂයක්, පන් ලක්ෂයක්*
*විමසූහ එක හඬින්:*
*"පරදවනු බැරි වෙයිද මරණය*
*විසල් ආදරයකට මෙතරම්?"*
*අහෝ එද, නොසෙල්විණි මළ සිරුර*

*මිලියන ගණනක් මහ සෙනග*
*දසතින් පැමිණ හඬමින්*
*රැඳෙමින ඔහු සිරුර අස*
*මුර ගෑහ එක හඬින්*
*"හැර නොයනු සොයුර අප"*
*අහෝ එද, නොසෙල්විණි මළ සිරුර*

*අවසන,*
*මහ පොළොව මත වසන*
*සියළු මිනිස් වග පැමිණ*
*වටකළහ නිදන ඔහු සිරුර.*

*දුංඛිත මළ සිරුර සෙලවිණ!*
*දුටුයෙන් ඒ මිනිස් කැළ.*
*නැගිට සෙමින්- සිපගති පළමු මිනිසා*
*ඉන්පසු,*
*ඇවිද යන්නට විය!*

*C?SAR VALLEJO (1895-1939) (Peru)*
*(පීරු කවි සීසර් වෙලජෝ විසින් ලියන ලද්දක අනුවාදයකි.)*

## 2. අර්නෙස්ටෝ "චේ" ග්වාරාගේ ජීවිතය ගැන සටහන්



අර්නෙස්ටෝ "චේ" ග්වාරා ද ලා සර්නා, 1928 ජූනි 14 වන දා ආජන්ටිනාවේ රොසාරියෝහී දී උපත ලැබුවේය. අර්නෙස්ටෝගේ පියා අර්නෙස්ටෝ ග්වාරා ලින්ච්, අයර්ලන්ත පරපුරකින් පැවත ආ සිවිල් ඉංජිනේරුවෙකු වූ අතර මව සීලියා ද ලා සර්නා, ස්පාඤ්ඤ සම්භවයක් සහිත කාන්තාවක වූවාය. ඔවුන්ගේ පවුල වාමාංශික නැඹුරුතාවයක් සහිත මධ්‍යම පාන්තික පවුලක් විය. ග්වාරාවරු නිදහස් සිතුම් පැතුම් ඇත්තෝ වූහ. ඔවුහු ජෝසේ මාටි ගරුත්වයෙන් සැලකූ අතර ස්පාඤ්ඤ සිවිල්



යුද්ධයේදී රිපබ්ලික්වරුන්ගේ පාර්ශ්වයට අයත් වූවෝ වූහ.

පවුලේ දරුවන් පස් දෙනාගෙන් වැඩිමලා වූයේ චේ ය. සීලියා, රොබර්ටෝ, ඇනා මාරියා සහ ජෝන් මාර්ටින් (වයස් පිළිවෙළින්), චේ ගේ සොයුරු සොයුරියන් වූහ.

### ජෝස් ඇගුලාර් [JOES AGUILAR] මෙසේ කියයි :

1957 දී මගේ පවුලේ අය ස්පාඤ්ඤයේ සිට ආජන-ටිනාවට පළා ආවා. එහිදී කෝර්ඩෝබා පළාතේ නගරයක් වූ අල්ටා ග්‍රාෂියා වලදි තමා අපට මුලින්ම ග්වාරාවරු මුණ ගැහුණේ. අපේ පවුල්වල ළමයින් හැමෝම එකට සෙල්ලම් කළා. එකට දවස් ගෙවුවා. බොහෝ විට ග්වාරා ළමයි ක්‍රීඩාවලදී හරිම නිර්භීතයි.... ඇත්තම කියනවනම් අපි එයාලට ටිකක් බයේ හිටියේ. අර්නෙස්ටෝ (චේ) නිතරම ප්‍රිය කළේ දරදඬු ක්‍රීඩාවලට.

මට මතකයි රොබර්ටෝ කිවුවා වතාවක් අර්නෙස්ටෝ එයාලගෙ ගෙදර තුන් වෙනි තට්ටුවේ ඉඳන්, අඩි තුනක් එහායෙන් තිබුණු වෙනත් ගෙදරක තට්ටුවකට පැන්න හැටි. එයා මේවා කළේ විනෝදයටයි අනික් ළමයි සතුටු කරන්නයි.... මොකද ඒ වගේ දෙයක් කරන්න තරම් කවුරුත් එඩිතර නොවුණු නිසා.

ඔය කාලෙ අපේ ප්‍රියතම ලේඛකයෝ තමා ජූල්ස් වර්න් සහ ඇලෙක්සැන්ඩර් ඩූමාස්.

පස්සෙ අර්නෙස්ටෝ කෝර්ඩෝබාවේ උසස් විදුහලේ ඉගෙන ගන්න ගියා. එහෙදී එයා ඉංග්‍රීසි ඉගෙන ගත්තා වුනාට, වැඩියෙන්ම කැමති වුනේ ප්‍රංශ භාෂාව ඉගෙන ගන්න. අර්නෙස්ටෝ අම්මාගෙන් ප්‍රංශ ඉගෙන ගත්තා. එයා හරි කැමතියි ප්‍රංශ කවි කියවන්න. පැබ්ලෝ නෙරූදාගේ කවි වලට කොච්චර කැමති වුනා ද කියනවනම් දවස් ගණන් යනකල් එයා ඒ කවි කට පාඩමින් මහ හයියෙන් ගායනා කෙරුවා.



එයා වයස දා හතර වගේ පොඩි කාලෙම සිග්මන් ෆ්‍රොයිඩ් කියවන්න ගත්තු එක ගැනයි, ඒක ගැන එයගෙ අම්මලා තාත්තලා හොයල නොබලපු එකයි ගැන අපේ තාත්තා නම් හිටියෙ කේන්තියෙන්.

### ෆර්නැන්ඩෝ බරල් [FERNANDO BARRAL] මෙසේ කියයි:

මට අර්නෙස්ටෝ මුලින්ම හමු වුනේ 1940 දී. ඒ වෙද්දිත් එයා පුදුම ආත්ම විශ්වාසයක් තිබුණු, ස්වාධීන තීරණ ගන්න කෙනෙක්. ඔය කාලෙ අර්නෙස-ටෝ හරිම කඩිසරයි. කලබලකාරියි. සම්ප්‍රදායන් ප්‍රශ්න කරනවා. මම හිතන්නෙ මම රහසින් ඔහුගේ මේ හැකියාවන් සහ ආත්ම ශක්තිය ගැන ගැන ඊර්ෂ්‍යා කෙරුවා. එයාගෙ තිබ්බ හරිම ආකර්ශනීය ලක්ෂණය වුනේ මේ නිර්භීතකම. අර්නෙස්ටෝ රග්බි සෙල්ලම් කරපු විදිහට අපි හරි කැමති වුනා. අපි හැමෝගෙන්ම එයා වෙනස් වුන මූලිකම කාරණය තමා එයාගෙ තිබුණු මේ මුරණ්ඩු, යටත් නොවෙන ස්වභාවය.

### ඇල්බර්ටෝ ග්‍රෙනාඩෝස් [ALBERTO GRANADOS] මෙසේ කියයි:

අර්නෙස්ටෝව මට මුලින්ම හමුවුනේ 1941 දී. එයා මගේ මල්ලි- තෝමස් එක්ක උසස් විද්‍යාලයේ ඉගෙන ගන්න කාලෙ. එතකොට මම හිටියෙ විශ්ව විද්‍යාලේ. අපි කෝර්ඩෝබා ශිෂ්‍යයෝයි වෙනත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝයි එක්ක එකතු වෙලා, විශ්ව විද්‍යාලේ තිබුණු දූෂණ වලට එරෙහිව උද්ඝෝෂණ වල යෙදිලා හිටියෙ. ඒකෙන් මාව අත් අඩංගුවට අරගෙන කෝර්ඩෝබාවේ මධ්‍යම පොලිස් දෙපාර්තමේන්තුවට අරගෙන ගියා. අත් අඩංගුවට ගත්තා කියනවට වඩා ඒක පැහැරගෙන යාමක් වගෙයි- මොකද අපිට නඩු පැවරුවේ නැති හන්දා.

මේ කාලෙ මගෙ මල්ලි තෝමස් හිර ගෙදරට කෑම අරගෙන ආවා- එතනදි අපිට කන්නවත් දුන්නෙ නැති හන්දා. දවසක් තෝමස් එක්ක එයාගෙ ඉස්කෝලෙ යාළුවා අර්නෙස්ටෝත් ආවා. මං එයාලට කිවුවා හිරේ ඇතුළෙ අපිට සලකන විදිහ කියලා මිනිස්සු දැනුවත් කරන්න උසස් විද්‍යාලයේ ශිෂ්‍යයෝ එළියේ පෙළපාළි යන්න ඕනෙ කියලා. මේ යෝජනාවට තරුණ අර්නෙස්ටෝ ග්වාරා දක්වපු ප්‍රතිචාරයෙන් මම මවිත වුනා.

ඔහු කිවුවා....
"වැඩක් නෑ..... මොකුත් වෙන්නෙ නෑ..... ඇල්බර්ටෝ, පාරට බැහැලා පොලිසියෙ පොලු මුගුරු වලින් ගුටි කන්නද? වැඩක් නෑ. ඔබ මට තුවක්කුවක් දුන්නොත් මං ගිහින් පෙළපාළි යන්නම්..... උද්ඝෝෂණය කරන්නම්.....!"

### චේ [CHE] මෙසේ කියයි:

වයස පහළොවේ දී, මිනිසෙක් ඒ වන විටත් තමා මිය යා යුත්තේ කුමක් වෙනුවෙන්දැයි දනී! එබඳු පරිත්‍යාගයක් කිරීම පහසු කරවන්නට තරම් සමත් පර්මාදර්ශයක් ඒ වන විටත් ඔහුට හමු වී තිබේ නම්, ඔහු එසේ මිය යන්නට බිය නොවේ.

### ඇල්බර්ටෝ ග්‍රෙනාඩෝස් [ALBERTO GRANADOS] මෙසේ කියයි:

අර්නෙස්ටෝ සහ අප අතර තිබූ ප්‍රධානතම සමානකමක් වූයේ ක්‍රීඩාශීලීත්වයයි. මුළු ජීවිත කාලය පුරාම චේ ඇදුම රෝගයෙන් පීඩා විඳි බව ප්‍රකට කරුණක්. එසේ තිබියදී පවා ඔහු ක්‍රීඩාවට ඇලුම් කළා. කාව්‍ය සහ ක්‍රීඩාව අතර දෝලනය වූ අධ්‍යාපනය මගින් ඔහුට අධ්‍යාත්මික උත්තේජනයක් ලැබුනා. එයින් ඔහු ශාරීරිකව ශක්තිමත් වුනා.

අර්නෙස්ටෝ තුළ තිබුණු සංචාරයටත් අනතුරුදායක ක්‍රියාකාරකම් වලටත් වූ ගිජුකම මේ ක්‍රීඩාශීලීත්වයේම දිගුවක්. ඔහු උසස් විද්‍යාලයේත් මම විශ්ව විද්‍යාලයේත් ඉගෙන ගනිමින් සිටි නමුත්, කෙමෙන් අප එකිනෙකාගේ සමාගමය ප්‍රිය කරන මිතුරන් බවට පත් වුනා. ඔහුගේ බුද්ධිමත්බව සහ දැනුම හඹා යාමේ ලොල් බව නිසා අපි සියල්ලෝ ඔහුව ප්‍රිය කළා. මම අර්නෙස-ටෝගේ සහෝදරයාගේ පුස්තකාලයට නිතර නිතර ගියා. බොහෝ පොත්වල පළමු කියවන්නා වූයේ අර්නෙස්ටෝ. දෙවැනි කියවන්නා වූයේ මමයි. හැම ආකාරයකින්ම සුවිශේෂී වූ අනාගත ජීවිතය වෙනුවෙන් කිසියම් වූ බුද්ධිමය ඉවක් චේ ළඟ තිබුනාය කියා මට හිතෙනවා.

ඔහු අපිත් එක්ක රට තුළට ගියපු සංචාර වලින් සතුටු වුනා. ඉගෙන ගත්තා. පස්සෙ කාලෙක අපි දෙන්නා මහාද්වීපය හරහා ගිය ප්‍රකට මෝටර් සයිකල් සංචාරයට මේ හැම මුල් කාලීන අත්දැකීමක්ම උදවු වුනා. ඊටත් අවුරුදු ගානකට පස්සෙ සටන් බිමේ ගරිල්ලාවෙකු විදිහට චේ කළ වැඩ කොටසෙදි වුනත් මේ සවාරි වලින් ලැබුණු පන්නරය වැදගත් වුනා. උදාහරණයකට, ඉතාම අඩු ආම්පන්න ගණනකින් ටෙන්ට් එකක් (කූඩාරමක්) අටවා ගන්නා විදිහ ගැන මුල්ම පාඩම අපි ඉගෙන ගත්තේ මේ සංචාර වලින්. ඒවා ඒ දිනවල හුදෙක් එකාකාරී එදිනෙදා නාගරික ජීවිතයෙන් පළා යන්න කරපු "කොලු වැඩ" වුනත්, අපිත් නොදැනුවත්වම අපේ ඉලක්ක වලට යන්නට ඒවා උදවු වුනා.

1946 දී අර්නෙස්ටෝ ග්වාරා උසස් විද්‍යාලයෙන් ලැබූ අධ්‍යාපනය නිමා කළේය. ග්වාරා පවුල බුවර්නෝස් අයර්ස් නුවර

ලියන්නේ
කූඹියා
<koombiyaonline@gmail.com>